දෙපාර්තමේන්තු චක්‍රලේඛ: - 04/2025

මගේ අංකය: - DAPH/AH/02/07/05
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
පේරාදෙණිය.

2025.06. 12

පළාත් ප්‍රධාන ලේකම් මඟින්,
පළාත් අධ්‍යක්ෂ - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින්,
සියලුම දිස්ත්‍රික් පශු වෛද්‍ය නිලධාරීන් / නියෝජ්‍ය අධ්‍යක්ෂ වරුන්/ රජයේ පශු වෛද්‍ය නිලධාරීන්,

අධ්‍යක්ෂ සත්ත්ව සෞඛ්‍ය මඟින්,
සියලුම පශු විමර්ශන නිලධාරීන් වෙත,

<u>රැනිකට් රෝගය (Ranikhet/Newcastle disease) වළක්වා ගැනීම</u>

රැනිකට් රෝගය ශ්‍රී ලංකාවේ ඇතැම් ගොවිපළ වලින් වාර්තා වන පක්ෂි වසංගත රෝගයක් වශයෙන් හඳුනාගෙන ඇත. මෙම රෝගය බොහෝ විට වාර්තා වන්නේ ගෘහාශ්‍රිත කුකුළු ගොවිපළවලින් වන අතර කුකුළන් මිය යාම සහ බිත්තර නිෂ්පාදනය අඩාළ වීම නිසා අහිතකර ආර්ථිකමය බලපෑම් ඇති කරනු ලබයි.
මීට අමතරව සජීවී කුරුල්ලන්, කුකුළු මස් හා බිත්තර අපනයනයේදී බොහෝ රටවල් වලින් රට තුළින් රැනිකට් රෝගයෙන් තොර කුකුළු ගහණයක් බලාපොරොත්තු වේ.

එබැවින්, රට තුළ මෙම රෝගය පාලනය කිරීම මඟින් ගොවීන්ට ඇති අහිතකර ආර්ථිකමය බලපෑම අවම කර ගත හැකි වන අතර කුකුළු කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීම පුළුල් කිරීමට ද බලාපොරොත්තු වේ.

1992 අංක 59 දරන සත්ත්ව රෝග පනත අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රැනිකට් වසංගත රෝග තත්ත්ව පාලනය කිරීම සඳහා මෙම මාර්ගෝපදේශ නිකුත් කරනු ලබන අතර ඒ සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග ගත යුතු වේ.

**01.** වසංගත රෝග තත්ත්වය තහවුරු කර ගැනීම

1. 1992 අංක 59 දරන සත්ත්ව රෝග පනත අනුව රැනිකට් රෝගය දැනුම් දිය යුතු පක්ෂි වසංගත රෝගයක් වශයෙන් වර්ගීකරණය කර ඇත. එම නිසා රෝගී තත්ත්වයන් වාර්තා කිරීම සඳහා නිකුත් කර ඇති චක්‍රලේඛයට අනුව ක්‍රියා කළ යුතුව ඇත.

2. ඒ අනුව කිසියම් පශු වෛද්‍ය නිලධාරී කොට්ඨාශයකින් රැනිකට් බවට සැක කරන රෝග ලක්ෂණ සහිත පක්ෂීන් හමු වන්නේ නම් අදාළ ක්ෂේත්‍ර භාර පශු වෛද්‍ය නිලධාරී වරයා විසින් ඒ බව නොපමාව අදාළ පළාත් අධ්‍යක්ෂ, අධ්‍යක්ෂ (සත්ත්ව සෞඛ්‍ය අංශය, සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව) සහ අදාළ දිස්ත්‍රික් පශු විමර්ශන නිලධාරී වෙත දුරකථනය/ෆැක්ස්/ඊමේල් මඟින් දැනුම් දීම සිදු කළ යුතුය.

3. ඊට අමතරව රෝග ලක්ෂණ සහිත පක්ෂීන් පිළිබඳ තොරතුරු වාර්තා වී පැය 24 ක් ගතවීමට පෙර අදාළ ක්ෂේත්‍ර භාර පශු වෛද්‍ය නිලධාරී විසින් ඒ පිළිබඳව විමර්ශනය කළ යුතු අතර පශ්චාත් මරණ පරීක්ෂණ ද සිදුකර වසංගත රෝග මූලික විමර්ශන වාර්තාව (FA/OH/32 - ඇමුණුම 01) සහ සතිපතා වසංගත රෝග වාර්තාව (FA/OH/33 - ඇමුණුම 02) විධිමත්ව සම්පූර්ණ කර පළාත් අධ්‍යක්ෂ හා අධ්‍යක්ෂ (සත්ත්ව සෞඛ්‍ය

අංශය, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය) වෙත වහාම ඉදිරිපත් කළ යුතුය.

4. රෝගය පැතිරී යන අවස්ථා වලදී අදාළ පශු විමර්ශන නිලධාරී විසින් රෝග විමර්ශනයක් සිදුකර ඒ පිළිබඳ වසංගතවේද වාර්තාවක් අධ්‍යක්ෂ සත්ත්ව සෞඛ්‍ය වෙත ඉදිරිපත් කළ යුතු වේ.

5. රෝග තත්ත්වය නිර්ණය කිරීම සඳහා අවශ්‍ය වෛරසවේද/පටකවේද සාම්පල ලබා ගැනීම සහ ක්ෂණික ප්‍රතිදේහජනක පරීක්ෂා (Rapid Antigen Test) සිදු කිරීම දිස්ත්‍රික් පශු විමර්ශන නිලධාරීන් විසින් නොපමාව සිදු කළ යුතු අතර එම කාර්යය සඳහා ප්‍රදේශය භාර පශු වෛද්‍ය නිලධාරීන්ගේ පූර්ණ සහාය ලබා දිය යුතුය.

6. දිස්ත්‍රික් පශු විමර්ශන නිලධාරීන් විසින් ලබා ගන්නා ලද නියැදි පශු පර්යේෂණ ආයතනය වෙත හැකි ඉක්මනින් ලබා දිය යුතුය.

7. විෂාණු රසායනාගාරය, පොල්ගොල්ල (පශු පර්යේෂණායතනය) මගින් ලැබුණු නියැදි පරීක්ෂා කර අදාළ පරීක්ෂණ වාර්තා දින 03 ක් ඇතුළත අධ්‍යක්ෂ, සත්ත්ව සෞඛ්‍ය අංශය වෙත ලබා දිය යුතු අතර ඊට සමගාමීව දිස්ත්‍රික් පශු විමර්ශන නිලධාරීන් දැනුවත් කිරීම ද සිදු කළ යුතුය.

**02.** රෝග ව්‍යාප්තිය අවම කිරීම සඳහා මූලික ක්‍රියා මාර්ග

1. පශු පර්යේෂණ ආයතනය වෙත භාර දෙන ලද සාම්පලවල තහවුරු වූ වාර්තා ලැබෙන තෙක් ක්ෂණික ප්‍රතිදේහජනක පරීක්ෂාවට ධනාත්මක ප්‍රතිචාර දැක්වූ සතුන් හමු වූ සියලුම ගොවිපළවලින් පක්ෂීන් ප්‍රවාහනය වහාම අත් හිටවිය යුතුය. තහවුරු වූ වාර්තා ලැබුණු පසු මහේස්ත්‍රාත් නියෝග ලබා ගෙන (1992 අංක 59 දරන සත්ත්ව රෝග පනතේ අංක **4** වගන්තිය අනුව) ගොවිපළ පරිශ්‍රය මුද්‍රා තැබිය යුතුය.

2. රෝගය වැළඳී මුල් අවස්ථාවේ දී, මරණ ප්‍රතිශතය 10% ට අඩු අවස්ථාවල දී හා රෝග ලක්ෂණ ඉතා මෘදු ලෙස පවතින අවස්ථාවල දී, රානිකට් ප්‍රාථමික එන්නත භාවිතා කර ගොවිපළේ සිටින සියලුම නිරෝගී සතුන් එන්නත් කළ යුතුය.

3. රෝගය වැළඳීම නිසා මිය යන සියලුම සතුන්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ අනුව නිසි පරිදි බැහැර කළ යුතුය.

4. රෝගය වාර්තා වූ ස්ථානයේ සිට කිලෝමීටර් 03 ක අරීය ප්‍රදේශයක පිහිටි සියලුම ගොවිපළ වල (සුරතල් පක්ෂීන් ඇති කිරීමේ මධ්‍යස්ථාන ද ඇතුළුව) සිටින පක්ෂී ගහණය පිළිබඳ තොරතුරු කඩිනමින් පළාත් අධ්‍යක්ෂ, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සහ අධ්‍යක්ෂ, සත්ත්ව සෞඛ්‍ය අංශය, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත ලබා දිය යුතුය.

5. රෝග ව්‍යාප්තිය පිළිබඳව යාබද පශු වෛද්‍ය නිලධාරී කොට්ඨාශ භාර පශු වෛද්‍ය නිලධාරීන් නොපමාව දැනුවත් කළ යුතුය.

6. රෝගය ආරම්භ වූ ගොවිපළේ සිට කිලෝමීටර් 03ක අරීය ප්‍රදේශයක් තුළ පිහිටා ඇති සියලුම ගොවිපළ වල (සුරතල් පක්ෂීන් ඇති කිරීමේ මධ්‍යස්ථාන ද ඇතුළුව) සිටින, මාස 03ක් ඇතුලත රානිකට් රෝගය සඳහා ප්‍රතිශක්තිකරණ එන්නත් ලබා දී නොමැති සියලුම පක්ෂීන් සඳහා ආරක්ෂිත ප්‍රතිශක්තිකරණය ලබා දීම සඳහා විශේෂිත ප්‍රතිශක්තිකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අදාළ කොට්ඨාශ භාර පශු වෛද්‍ය නිලධාරී වරයා විසින් නොපමාව පියවර ගත යුතුය.

7. එන්නත්කරණය සඳහා අවශ්‍ය එන්නත් මාත්‍රා ලබා ගැනීම සඳහා, අදාළ ප්‍රදේශයේ/ ප්‍රදේශ වල සිටින පක්ෂි ගහණයට අනුව අවශ්‍ය එන්නත් මාත්‍රා ප්‍රමාණය ගණනය කර නොපමාව පළාත් අධ්‍යක්ෂ මගින් සත්ත්ව සෞඛ්‍ය අංශය වෙත දැනුම් දිය යුතුය.

## 03. රෝගය වළක්වා ගැනීමේ ක්‍රියාමාර්ග

### 3.1 මූලික ප්‍රතිශක්තිකරණය

1. රැනිකට් රෝගය වළක්වා ගැනීම සඳහා සියලුම ගොවිපළ වල සිටින පක්ෂීන් හට නියමිත කාල පරාසයන්හිදී රැනිකට් ප්‍රතිශක්තිකරණ එන්නත ලබා දීම අනිවාර්ය වේ.

2. මේ සඳහා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් නිපදවනු ලබන දේශීය එන්නත් හෝ අනුමත ආනයනික එන්නත් භාවිතා කළ හැක.

3. ඒ පිළිබඳව අදාළ කොට්ඨාශ භාර පශු වෛද්‍ය නිලධාරීන් විසින් ගොවීන් නිසි පරිදි දැනුවත් කිරීම සිදු කළ යුතුය.

4. දේශීයව නිපදවනු ලබන එන්නත පහත සඳහන් නිර්ණායකවලට අදාළව සත්ත්ව සෞඛ්‍ය අංශය වෙතින් නොමිලයේ ලබා ගැනීමේ පහසුකම් සළසා ඇත.

   - වයඹ සහ බස්නාහිර පළාත්බද ගොවිපළ සඳහා - පක්ෂි ගහණය 1000ක් හෝ ඊට අඩු ගොවිපළ සඳහා
   - අනෙකුත් පළාත්බද ගොවිපළ සඳහා - පක්ෂි ගහනය 400 ක් හෝ ඊට අඩු සියලුම ගොවිපළ සඳහා

5. සෑම පළාත් අධ්‍යක්ෂවරයෙකු විසින්ම ඉහත නිර්ණායකවලට අනුකූලව පළාතෙහි වාර්ෂික එන්නත් අවශ්‍යතාවය පෙර වර්ෂයේ අගෝස්තු මාසය වන විට අධ්‍යක්ෂ, සත්ත්ව සෞඛ්‍ය අංශය, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත අදාළ ආකෘතියට අනුකූලව (ඇමුණුම 3) ලිඛිතව දන්වා එවිය යුතුය.

6. අවශ්‍ය එන්නත් ලබාදීම දෙපාර්තමේන්තු මාර්ගෝපදේශවලට අනුව සිදු කළ යුතු අතර එන්නත් ලබා දීමේ දී, එන්නත් ශීතදාමය (cold chain) ආරක්ෂා කිරීම පිළිබඳව විශේෂයෙන්ම සැළකිළිමත් විය යුතුය.

### 3.2 - ජෛව ආරක්ෂණ ක්‍රම

1. නිදැලි, සුළු, මධ්‍යම හා මහා පරිමාණ කුකුළු නිෂ්පාදන ගොවිපළ, සහ සුරතල් පක්ෂීන් ඇති කිරීමේ මධ්‍යස්ථානවල සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජෛව ආරක්ෂණ මාර්ගෝපදේශ නිසි පරිදි පිළිපැදිය යුතු අතර එම ගොවිපළ දැනුවත් කිරීම සහ අධීක්ෂණය අදාළ කොට්ඨාශය භාර පශු වෛද්‍ය නිලධාරීවරයාගේ වගකීමක් වේ.

2. ජෛව ආරක්ෂණ ක්‍රම පිළිබඳව අභිජනන ගොවිපළ සහ නිෂ්පාදන අපනයන ගොවිපළ දැනුවත් කිරීම සහ අධීක්ෂණය සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සත්ත්ව සෞඛ්‍ය අංශය සහ දිස්ත්‍රික් පශු විමර්ශන නිලධාරීන් මගින් සිදු කරනු ලැබේ.

3. යම පශු වෛද්‍ය නිලධාරී කොට්ඨාශයක් තුළ පිහිටි සියලුම පක්ෂි ගොවිපළවල් අදාළ පශු වෛද්‍ය නිලධාරී කාර්යාලයෙහි ලියාපදිංචි විය යුතුය.

4. නව වාණිජ සහ නිදැලි ගොවිපළ ලියාපදිංචි කිරීමේ දී, අදාළ කොට්ඨාශය භාර පශු වෛද්‍ය නිලධාරී විසින් විධිමත් ස්ථානීය පරීක්ෂණයක් සිදු කළ යුතු අතර අදාළ ගොවිපළ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති ජෛව ආරක්ෂණ නිර්ණායකවලට අනුකූල නොවන්නේ නම් ඒ සඳහා අනුමැතිය ලබා දීමෙන් වැළකිය යුතුය.

5. යාවත්කාලීන කරන ලද සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කුකුළු අභිජනන ගොවිපළ ලේඛනය, අධ්‍යක්ෂ (පශු අණ පනත් හා නීති අංශය, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව) මගින් සියලුම පළාත් අධ්‍යක්ෂවරුන් හරහා සියලුම පශු වෛද්‍ය නිලධාරීන් වෙත වාර්ෂිකව ලැබීමට සළස්වනු ඇත.

3.3 සක්‍රීය රෝග ආවේක්ෂණය

1. සත්ත්ව සෞඛ්‍ය අංශයේ සම්බන්ධීකරණය යටතේ පශු විමර්ශන නිලධාරීන් විසින් සක්‍රීය රෝග ආවේක්ෂණ (Active surveillance) කටයුතු සිදු කරනු ලැබේ.
2. අවශ්‍ය අවස්ථාවන්හි දී අදාළ කොට්ඨාශ භාර පශු වෛද්‍ය නිලධාරීන් විසින් එම කාර්යයන් සඳහා පශු විමර්ශන නිලධාරීන් හට අවශ්‍ය සහයෝගය දැක්විය යුතු වේ.

ආචාර්ය කේ. ඒ. සී. එච්. ඒ. කොතලාවල
අධ්‍යක්ෂ ජනරාල්
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

ආචාර්ය කේ.ඒ.සී.එච්.ඒ. කොතලාවල
අධ්‍යක්ෂ ජනරාල්
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
තැ.පෙ. 13. ගැටඹේ
පේරාදෙණිය

පිටපත්:
1. ලේකම්, කෘෂිකර්ම, ඉඩම්, පශු සම්පත්, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය - කා. දැ. ගැ. ස.
2. අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, - කා. දැ. ගැ. ස
3. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව, - කා. දැ. ගැ. ස
4. සියලුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වරුන්, - කා. දැ. ගැ. ස
5. සියලුම අධ්‍යක්ෂ වරුන්, - කා. දැ. ගැ. ස
6. ප්‍රධාන වසංගතවේදී විශේෂඥ, - කා. දැ. ගැ. සහා. අ.ක. ස
7. ප්‍රධාන වන්නත්වේදී - පශු පර්යේෂණායතනය - කා. දැ. ගැ. සහා. අ. ක. ස
8. ප්‍රධාන ගණකාධිකාරී / ප්‍රධාන අභ්‍යන්තර විගණක , - කා. දැ. ගැ. ස
9. විගණකාධිපති, - කා. දැ. ගැ. ස